පන්නල ප්‍රාදේශීය සභාව

--------------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශනඉදිරිපත්කිරීම</u>

සමාලෝචිතවර්ෂයේ මූල්‍ය ප්‍රකාශන2012 මාර්තු 30 දින ද ඉකුත්වර්ෂයටඅදාල මූල්‍ය ප්‍රකාශන2011 මැයි 11 දින ද විගණනයටඉදිරිපත්කරතිබූඅතරසමාලෝචිතවර්ෂයේ විගණකාධිපති වාර්තාව2012 ඔක්තෝබර් 17 දිනසභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 <u>මතය</u>

සභාපතිවරයා වෙත යවන ලද මාගේවාර්තාවේ දක්වා ඇතිඅදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙනවිගණනය සඳහා ඉදිරිපත්කරඇතිපන්නලප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වර්ෂය සඳහා ව මූල්‍ය ප්‍රකාශනපිළිබඳ මතයක්ප්‍රකාශකිරීමට මට නොහැකිය.

1.3 <u>මූල්‍ය ප්‍රකාශනපිළබඳඅදහස් දැක්වීම</u>

1.3.1 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

<u>තොරතුරු විගණනයටඉදිරිපත් නොකිරීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයටඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.278,848,231ක්වූ ගනුදෙනුවිගණනයේදීසතුටුදායක ලෙසසන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශනඅනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,730,118 ක්වූ අතර, ඊටඅනුරූපීවඉකුත්වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,882,296 ක් විය.

2.2 <u>මූල්‍ය පාලනය</u>

2006 සිට 2010 කාලපරිච්ඡේදයටඅදාල රු.3,566,137 කවූ කර්මාන්ත ණය හිඟ ශේෂය සමාලෝචිතවර්ෂය අවසානය වන විටදනිරවුල්කර නොතිබුණි.

2.3 <u>ආදායම් පරිපාලනය</u>

2.3.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්</u>

සභාපතිවරයා විසින්සමාලෝචිතවර්ෂයටඅදාලවඉදිරිපත්කරතිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනටසමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | ------------------ | -------------------- | ------- | -------------------- |
| | | රු000' | රු.000' | රු.000' |
| (i). | වරිපනම් හා බදු | 7,141 | 7,613 | 2,962 |
| (ii). | බදුකුලී | 19,413 | 15,783 | 12,413 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 1,061 | 999 | 1,062 |
| (iv). | වෙනත් ආදායම් | 69,767 | 57,001 | 12,766 |

2.3.2 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත්සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත්බලධාරින්ගෙන්2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුවතිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i). | උසාවි දඩ | 5,096,263 |
| (ii). | මුද්දර ගාස්තු | 7,509,021 |

2.3.3 <u>ආදායම් පරිපාලනය</u>

පහත නිරීක්ෂණයන්කරනු ලැබේ.

(අ) <u>වරිපනම් බදු</u>

සමාලෝචිතවර්ෂය අවසානය වන විටවරිපනම් බදු හිඟය රු.2,271,359ක්වූ අතරප්‍රධානකාර්යාලයටඅදාලවවසර 5 ටවඩා වරිපනම් බදු හිඟ දේපල 60 ක හිඟ බදු ශේෂය රු.408,709 ක් විය. හිඟ මුදල්අයකරගැනීම සඳහා 1987 අංක 15 දරණප්‍රාදේශීය සභාපනතේ 158 වගන්තිය හා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති 33 සිට 41 ප්‍රකාරවකටයුතුකර නොතිබුණි. හිඟ මදලින් රු.99,824 ක ලේඛනවල දුර්වලතා නිසා අයකරගැනීමට නොහැකි වී ඇති බවද ඉතිරි මුදල් කොටස්වශයෙන් අයවන බවදසභාපති 2012 ඔක්තෝබර් මාසයේදී මා ෙ වත වාර්තා කරතිබුණි.

(ආ). <u>අක්කර බදු</u>

යක්විලඋපකාර්යාලයටඅදාලව රු.80,000 ක හිඟඅක්කර බදු ශේෂයක්ද පැවතුණි.

(ඇ). වෙළඳබලපත්‍ර ගාස්තු

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති59 පරිදිවර්ෂය ආරම්භයේදීබලප්‍රදේශය තුලපරීක්ෂණයක් පවත්වා 1987 අංක 15 දරණප්‍රාදේශීය සභා පනතේ 150(1) වගන්තිය ප්‍රකාරවකර්මාන්තපිළිබඳ ලැයිස්තුවක්පිළියෙල කර වෙළඳබලපත්‍ර ගාස්තුඅයකලයුතුවුවත්, ඒඅනුවකටයුතු නොකරබලපත්‍රඉල්ලුම්කිරීම හා ගාස්තු ගෙවීම මත එම බලපත්‍ර හිමියන්ගේනම්පමණක් ලේඛනවලටඇතුලත්කරතිබුණි.

2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින්තහවුරු නොවූ ගනුදෙනු

ගිණුම්වල දිගින් දිගටම පවතිනඅයකරගත නොහැකි රු.971,587 ක්වූ වෙළඳබලපත්‍ර ගාස්තුප්‍රමාණයක්සමාලෝචිතවර්ෂය තුලදීජනල්සටහන් 02 මගින්කපාහැර තිබුණ ද 1987 අංක 15 දරනප්‍රාදේශිය සභා පනතේ 182 වගන්තියේ විධිවිධාන පරිදිඅමාත්‍යවරයාගේඅනුමැතිය ලබාගෙන නොතිබුණි.

2.5 මානවසම්පත් කළමනාකරණය

(අ). කළමනාකරණසහකාර සේවයේ අධි පන්තියේ තනතුරක්වූ ලේකම්තනතුරපුරප්පාඩුව පැවතිඅතර එහි වැඩ බැලීම සඳහා 2010 නොවැම්බර් මසසිට පළාත්පාලනනිළධාරියකුපත්කරතිබුණි. ආදායම් පරිපාලකතනතුරු 03 න් 02 ක් හා පුස්තකාලයාධිපති තනතුරු 04 න් 01 ක්සමාලෝචිතවර්ෂය අවසන්වන විටපුරප්පාඩුව පැවතුණි.

(ආ). කම්කරු, මුරකරු, රියදුරු වැනිතනතුරු නාම යටතේඅනුමතසංඛ්‍යාව 84 ක්වූ අතර, එයින් 71 දෙනෙකුපමණක්බඳවාගෙනතිබුණද, අනියම් ආදේශකපදනම මත සභාවෙන්වැටුප්ලබන 41 දෙනෙකුසමාලෝචිතවර්ෂය අවසාන වන විටසභාවට අනුයුක්තව පැවතුණි.

2.6 කොන්ත්‍රාත්පරිපාලනය

වැටකෙයාවසාප්පුසංකීර්ණය ඉදිකිරීම

එකවර ගෙවන මුදල් හා සභා අරමුදල් යොදවා තිබූ මෙකීකර්මාන්තයඉදිකිරීම සඳහා පුද්ගලික කොන්ත්‍රාකරුකුසමග රු.7,204,172 කගිවිසුමකට 2004 ජූලි 09 දින එළඹ තිබුණි. පහත කරුණුනිරීක්ෂණය කෙරේ.

(i). කොන්ත්‍රාත්ගිවිසුමේකොන්දේසිඅංක 3 අනුව මාස හය කින්එනම් 2005 ජනවාරි 08 දිනකර්මාන්තය සම්පූර්ණකරසභාවට භාරදිය යුතුය. නමුත්සමාලෝචිතවර්ෂය අවසානය වන විටත්එනම්ගිවිසුම්කාලය ඉක්මවා වර්ෂ 6 කත් මාස 10 ක්ගතවීතිබුණ දකර්මාන්තය සම්පූර්ණකරභාරදී නොතිබුණි. ප්‍රමාද කාලසීමාවතුලතිස්දෙවතාවක්කාලය දීර්ඝකරතිබුණදකිසිදු අවස්ථාවක කර්මාන්තය නිම කිරීම සඳහා නිශ්චිත දිනයක්නියම කර නොතිබුණි.

(ii). කොන්ත්‍රාත්කරුගේප්‍රමාදයන්සඳහා සභාවකාලය දීර්ඝකිරීම නිසා රු.1,672,195 ක මිල විචලනයක්උද්ගතවතිබුණි. 2012 පෙබරවාරි 03 දිනවිට රු.836,098 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා

තිබුඅතරව්‍යාපාරිකකටයුතුසඳහා වෙළඳසංකීර්ණය විවෘතව නොපැවතිඅතර විදුලිය ලබාගැනීම සඳහා රු.1,700,000 ක අතිරේක ඇස්තමේන්තුවක්ඉදිරිපත් වී තිබුණි.

(iii)මෙම වෙළඳසංකීර්ණයේ කඩකාමර 24 කින්කඩකාමර 8 ක්සමාලෝචිතවර්ෂය අවසන්වන විටත්ගැනුම්කරුවන්ඉදිරිපත් නොවීමෙන්ලබාදීමට නොහැකි වී තිබුණි. බදුගෙනතිබූකඩකාමර 3 කටඅදාලවවාරික 3 ක් යටතේ ගෙවීමටතිබුණු මුදලින්එක්වාරිකයක්පමණක් ගෙවීම නිසා වාරික 2 ක හිඟ මුදල ලෙස තවදුරටත්අයවිය යුතු රු.745,330 ක මුදලක් පැවතුණි. මෙම කඩකාමරඉදිකිරීම 2004 වර්ෂයේ ආරම්භකරතිබූඅතර 2011 වන විටත් විදුලි බලය ලබාගෙන විධිමත් ලෙසකඩ හිමියන්ට පැවරීමක්කර නොතිබුණි.

## 2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ). සමාලෝචිතවර්ෂයටඅදාලවඉඩම් හා ගොඩනැගිලිපිළිබඳවසමීක්ෂණයක්කර නොතිබුණි.

(ආ) සභාවේ සේවය කර විශ්‍රාම ගන්වා ඇති පළාත්පාලන විශ්‍රාම වැටුප්අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයින්ටඅදාලවසභාවවිසින්එකීඅරමුදලට ගෙවිය යුතු දායක මුදල්නිසිපරිදි නොගෙවීම නිසා සමාලෝචිතවර්ෂය අවසානය වන විටඑකීඅරමුදලට ගෙවිය යුතු ශේෂය රු. 4,124,586 වතිබුණි.

(ඇ). ආයතනයටඅදාලවසංයුක්තසැළැස්මක් හා සමාලෝචිතවර්ෂයටඅදාලවක්‍රියාකාර්සැලැස්මක්පිළියෙල කරනොතිබුණි.

## 2.8 අභ්‍යන්තරවිගණනය

සමාලෝචිතවර්ෂයටඅදාලවවිගණන හා කළමනාකරණකමිටුවක්පත්කර නොතිබුණුඅතර, අභ්‍යන්තරවිගණනවැඩසටහනක් යටතේප්‍රමාණවත්අභ්‍යන්තරවිගණනයක්දසිදුවී නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන්පද්ධති හා පාලනක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) කොන්ත්‍රාත්පරිපාලනය